# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,127- 2019 ජුනි මස 07 වැනි සිකුරාදා - 2019.06.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1096 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1097 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 ජුනි මස 28 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ජුනි මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## සමුපකාර සේවක කොමිෂන් සභාව - වයඹ පළාත

### විනය පරීක්ෂණ නිලධාරී මණ්ඩලය

වයඹ පළාතේ පළාත් සභාවේ 1995 අංක 5 දරන වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ 11 (i) (ඉ) හා (ඊ) වගන්ති සහ 1997.09.19 දිනැති *ගැසට් පත්‍රයේ* පළ වූ සංශෝධිත රෙගුලාසි මාලාවේ 9 වගන්තියේ සඳහන් 96 වගන්තිය සඳහා වූ සංශෝධනය යටතේ කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ විනය පරීක්ෂණ නිලධාරී මණ්ඩලය සඳහා අයදුම්පත් කැඳවා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයෙන් පහත නම් සඳහන් මහත්ම/මහත්මීන් තෝරා පත් කරගෙන ඇති බව මෙයින් දන්වා සිටින අතර, 2016.02.26 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv (අ) වැනි කොටසේ පළ කරන ලද 15 දෙනෙකුගෙන් යුත් විනය පරීක්ෂණ මණ්ඩලය මින් අවලංගු කරන බව ද දැනුම් දෙමි.

| *අ.අ* | *නම* | *ලිපිනය* |
|---|---|---|
| 01. | කේ. ඒ. ප්‍රේමදාස මහතා | අංක 123, පියුස්වත්ත, මිල්ලව, කුරුණෑගල |
| 02. | බර්නාඩ් ලියනගේ මහතා | සමාධි, හලාවත |
| 03. | එස්. ඒ. එදිරිසිංහ මහතා | අංක 167, හළුගම, පොතුහැර |
| 04. | එස්. ඒ. සුනිල් ජයතිලක මහතා | අංක 75, ජයරම්‍ය, අඹකොළවැව, අඹන්පොල |
| 05. | බී. එම්. එන්. කේ. බාලසූරිය මහතා | ගින්නේරිය පාලම අසල, වදාකඩ |
| 06. | ඩබ්ලිව්. ඒ. ඩී. එච්. කුලරත්න මහතා | අංක 23, උඩුමුල්ල, දොරටියාව |
| 07. | එච්. පී. ජී. අජිත් කුමාර මහතා | කුඹුක්වැව, දිගන්නෑව |
| 08. | එච්. ආර්. එම්. යූ. තිලකරත්න මහතා | අංක 92, පිලාකටුමුල්ල, නාත්තණ්ඩිය |
| 09. | ඒ. ධර්මවංශ මහතා | දම්පැලැස්ස, නාරම්මල |
| 10. | පී. එච්. එස්. පුෂ්පිකා සමන්ති මිය | කි. මී. 8 කණුව, තල්ගහගමවත්ත, බමුණාකොටුව |
| 11. | ආර්. පී. ජී. පියතිස්ස මහතා | අංක 4/286, පාසල අසල, හඳුගල |
| 12. | ඩබ්ලිව්. ඒ. ජයරත්න මහතා | අංක 6/14, නිශ්ශංක මාවත, කුරුණෑගල |
| 13. | ඩබ්ලිව්. ජී. චන්ද්‍රරත්න මහතා | අංක 497, කයිනැක, කයිකාවල |
| 14. | එස්. ඩී. ෂෙල්ටන් ලීලාරත්න මහතා | අංක 31/3, ජයශක්ති සෙවන, කහටවිල, පොතුවටවන |
| 15. | ඩබ්ලිව්. ආර්. එම්. සුමනවීර මහතා | කැලේගම වැවපාර, කැලේගම, අඩිප්පල |
| 16. | කේ. ජී. බණ්ඩාරමැණිකේ මිය | අංක 82, 7 වන පියවර, උයන්දන, කුරුණෑගල |
| 17. | ආර්. පී. නිමල්සිරි මහතා | පන්සල පාර, මදුරන්කුලිය |
| 18. | කේ. එම්. ජයතිලක මහතා | ඇල්වත්ත, වඳුරාගල, කුරුණෑගල |
| 19. | ඩබ්. එම්. සෝමරත්න වීරසූරිය මහතා | ගොරොක්ගස්දෙණිය, අලව්ව, මහගෙදර, ඇගල්ල |
| 20. | ටී. එම්. ආරියරත්න බණ්ඩා මහතා | අංක 51/2, ඔලුපැලියාව, බෝයගනේ |
| 21. | බී. ඒ. සිරිවර්ධන මහතා | අංක 79, පු/වීරපුර, සාලියවැව, හන්දිය |
| 22. | එම්. එම්. සරත් ප්‍රේමචන්ද්‍ර මහතා | අංක 87, කෝදුරුවාපොල, නක්කාවත්ත |
| 23. | පී. පී. ඩී. එස්. අජිත් චන්ද්‍ර කුමාර මහතා | කන්දේගෙදර, කුලි/වැවගම |
| 24. | ඒ. එම්. ග්‍රේෂන් අසෝකා මහතා | අංක 78/බී, සාන්ත සෙබස්තියන් මාවත, පට්ටියගම, මාදම්පේ |
| 25. | බී. එම්. ඒ. මොහාන් ද සිල්වා මහතා | පහල වඳුරාගල, මල්කඩුවාව, කුරුණෑගල |
| 26. | ඩී. එස්. දේශප්‍රිය වීරවංශ මහතා | අංක 54, සීගිරිඋයන, නව නගරය, මාදම්පේ |
| 27. | ආර්. ඩී. සඳරත්න මහතා | 16 වන පටුමග, එන්. එම්. අප්පුහාමි මාවත, ගෙපල්ලව, උහුමීය |
| 28. | එච්. පී. එම්. එස්. ඩී. පතිරාජ මහතා | අංක 32, බලගල්ලවත්ත, නාරංගල්ල, කිතලව |
| 29. | ජේ. එම්. දයාරත්න මහතා | ගලබඩවත්ත, හොරොම්බුව, වාරියපොල |
| 30. | බී. ආර්. අභයවික්‍රම බණ්ඩාර මහතා | දෙනිය, පනලිය, පොල්ගහවෙල. |

කොමිෂන් සභා නියමය පරිදි,

රේණුකා පී. විජේරූප,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ).

නව පළාත් සභා සංකීර්ණය,
දෙවන මහල,
කුරුණෑගල.
දුරකථන අංකය - 037-2228151/037-2233853

06-54

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

*වයඹ පළාතේ පළාත් සභා පාසල්වල පවතින ඉංග්‍රීසි භාෂා ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 (ඇ) ශ්‍රේණියට දිස්ත්‍රික් පදනම මත ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2018*

**2019.01.26 දින පැවැති ලිඛිත විභාගය අවලංගු කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,099 හා 2018.11.23 දිනැති *ගැසට් පත්‍රයේ* IV (අ) පළාත් සභා කොටසේ පළ කරන ලද වයඹ පළාතේ පළාත් සභා පාසල්වල පවතින ඉංග්‍රීසි භාෂා ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 (ඇ) ශ්‍රේණියට දිස්ත්‍රික් පදනම මත ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය 2018, එම විභාග නිවේදනයට අනුව 2018.12.31 දිනට අයදුම්පත් කැඳවා 2019.01.26 දින පැවති ලිඛිත විභාගය මෙයින් අවලංගු කරමි.

02. ඉහත *ගැසට්* නිවේදනයට අනුව අයදුම්පත්‍ර ඉදිරිපත් කළ අයදුම්කරුවන්ට හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,111 හා 2019.02.15 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද විභාග නිවේදනයට අනුව අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් සඳහා පමණක් නැවත විභාගයක් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. එම අයදුම්කරුවන් සඳහා විභාග ප්‍රවේශපත්‍ර නැවත නිකුත් කිරීමට කටයුතු කරනු ඇත.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ආර්. එම්. ආර්. එම්. රත්නායක,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල,
2019 මැයි මස 31 වැනි දින.

06-534

---

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ප්‍රජා සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය - 2019**

මධ්‍යම පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රජා සංවර්ධන නිලධාරි තනතුරේ පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති මධ්‍යම පළාතේ ස්ථිර පදිංචි ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *පොදු සුදුසුකම්.-*

1.1 අයදුම්කරු ශ්‍රී ලාංකික විය යුතුය.

1.2 අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

1.3 අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට පූර්වාසන්නයෙන් වූ වසර 03 ක කාලය තුළ මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

1.4 සෑම අයදුම්කරුවෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

1.5 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

1.6 තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

2. *අධ්‍යාපන සුදුසුකම් :*

මෙහි දැක්වෙන සුදුසුකම් 2019.07.15 දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රධානය කෙරෙන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන උපාධියක් ලබා තිබීම.

3. *වැටුප් පරිමාණය :*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි MN-4 - 2016 අනුව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය පහත පරිදි වේ :

රු. 31,490 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 5 x 750 = රු. 54,250

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 දරන චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් පරිදි 2019.01.01 දිනට වැටුප රු.28,235 කි. මෙම චක්‍රලේඛයෙහි විධිවිධාන පරිදි ඉදිරි වැටුප් ගෙවීම් සිදු කරනු ලැබේ.)

4. *බඳවා ගැනීමේ කොන්දේසි :*

මෙම තනතුරට අදාළව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බඳවා ගැනීමේ පරිපාටිය අනුව බඳවා ගැනීමේ කොන්දේසි තීරණය වේ.

5. *බඳවා ගැනීමේ ක්‍රමය :*

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකදී ලබා ගන්නා ලකුණු ප්‍රමුඛතාවය මත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර ලිඛිත විභාගයේදී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40% ක අවම ලකුණු ප්‍රමාණයක් ලබා නොගන්නා අයැදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සලකා බලනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමක් සිදු නොවන අතර මූලික සුදුසුකම් පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව ඔවුන් විසින් තරග විභාගයේදී ලබා ගත් ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව පුරප්පාඩු තනතුරුවලට බඳවා ගනු ලැබේ.

6. *සේවා කොන්දේසි :*

6.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

6.2 අදාළ පත්වීම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිමය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අදාළ අනෙකුත් චක්‍රලේඛවල සඳහන් විධිවිධානයන්ට යටත් වේ.

7. *අයැදුම් කිරීමේ ක්‍රමය :*

7.1 විභාග ගාස්තුව රු. 600 කි. මෙම විභාග ගාස්තුව මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන පරිදි මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ඒ සඳහා ලබා ගත් ලදුපතක් අයැදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙනසේ ඇලවිය යුතුය. එකී ලදුපත නොමැතිව එවන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර ගෙවන ලද විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

7.2 අයැදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට **2019.07.15** දිනට පෙර ලැබෙන සේ **''ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර''** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයැදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයැදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **''මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ප්‍රජා සංවර්ධන නිලධාරී III ශ්‍රේණියට බඳවා ගැනීම- 2019''** සහ **පදිංචි දිස්ත්‍රික්කය** සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයැදුම්පත් හා අසම්පූර්ණ අයැදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගතවන අයැදුම්පත් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වගකියනු නොලැබේ.

8. *විභාග මාධ්‍යය :*

විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අයදුම්පත්‍රයේ තමන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයට නියමිත අක්ෂරය පැහැදිලිව සඳහන් කළ යුතු අතර, එය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. *විභාග මධ්‍යස්ථානය :*

විභාග මධ්‍යස්ථානය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍රය මගින් දැනුම් දෙනු ලැබේ.

10. *ලිඛිත විභාගය හා විෂය නිර්දේශය :*

නියමිත සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් මෙම තනතුරට බඳවා ගැනීම සඳහා පහත සඳහන් විෂයයන් හා විෂය නිර්දේශයෙන් යටතේ ලිඛිත විභාගයකට යොමු කරනු ලැබේ.

10.1 අභියෝග්‍යතාවය හා බුද්ධි පරීක්ෂණය - (කාලය පැය 01 යි) (උපරිම ලකුණු 100 යි) (සමත් ලකුණු 40%)

අපේක්ෂකයාගේ භාෂා හැකියාව, ගණිතමය කුසලතාවය හා තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කර බැලීම සඳහා කෙටි හා බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

10.2 සාමාන්‍ය දැනීම හා විෂයානුබද්ධ දැනීම - (කාලය පැය 02යි) (ලකුණු 100 යි) (සමත් ලකුණු 40%)

මෙම ප්‍රශ්න පත්‍රයට ප්‍රජා සංවර්ධන විෂය ක්ෂේත්‍රයට අදාළ වන කරුණු සහ කාලීන සමාජ හා දේශපාලන තොරතුරු ආශ්‍රය කරගෙන සකස් කරනු ලබන බහුවරණ, කෙටි, ව්‍යුහගත හා රචනා ස්වරූපයේ ප්‍රශ්න ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි.

11. *අයදුම්පත් පිරවීම සඳහා උපදෙස් :*

ආදර්ශ අයදුම්පත් ආකෘතිය ප්‍රකාර ඒ4 ප්‍රමාණයක කඩදාසිය දෙපැත්තම භාවිතා කරමින් එහි පළමු පිටුවෙහි අංක 1-5 දක්වා කරුණු ද අනෙක් පිටුවල ඉතිරි ඡේදද ඇතුළත්වන සේ සකස් කර ගත යුතුය. අයදුම්පත්‍රය යතුරු ලියනය කර ගැනීමෙන් හෝ පැහැදිලි අත් අකුරින් සකස් කර ගත යුතුය. අයදුම්පත්‍රය පිරවීමේදී පහත දැක්වෙන සංකේත අංක නියමිත කොටුවල පැහැදිලිව සඳහන් කළ යුතුය.

11.1 අයදුම් කරන දිස්ත්‍රික්කය ලෙස සඳහන් කළ යුත්තේ අයදුම්කරුගේ ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කයට අදාළ සංකේත අංකයයි.

මහනුවර - 01
මාතලේ - 02
නුවරඑළිය - 03

11.2 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 ශ්‍රේණිගත කිරීමට අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

11.3 යම් අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර හෝ පත්වීම ලබා දීමෙන් පසු හෝ ඕනෑම අවස්ථාවකදී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය හෝ පත්වීම අවලංගු කෙරෙනු ඇත. එසේම දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත්කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

11.4 රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

12. මෙම විභාග පැවැත්වීම පිළිබඳව හෝ පැවැත්වීමෙන් පසු තේරා ගැනීම් කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එසේම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳව පැහැදිලි කිරීම/තීරණය කිරීම, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙ සතු වේ.

එම්. ජී. ඒ. තිලකරත්න,
ලේකම්,
මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2019 මැයි මස 04 වැනි දින,
මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර, මහනුවර.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ III වන ශ්‍රේණියේ ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම - 2019*

විභාග අංකය : [ ]
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : [ ] (සිංහල - S, දෙමළ- T ඉංග්‍රීසි - E)
(අදාළ සංකේතය කොටුව තුළ ලියන්න.)

පදිංචි දිස්ත්‍රික්කය : [ ] දිස්ත්‍රික්කයට අදාළ සංකේත අංකය : [ ]

01. 1.1 මුලකුරු සමග නම :..........................................................................
Mr./Mrs./Miss (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 මුලකුරු සමග නම :..........................................................................
මයා/මිය/මෙනෙවිය (සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................
..........................................................................

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) :..........................................
..........................................................................

02. 2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :..........................................
..........................................................................

2.2 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :..........................................
..........................................................................

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................
..........................................................................

2.4 දැනට රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් කාර්යාලයීය ලිපිනය :..........................................
..........................................................................

2.5 දුරකථන අංකය :.............................................................

03. 3.1 උපන් දිනය :...............................................................

3.2 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට (2019.07.15) වයස : අවු. : [ ] මාස : [ ] දින : [ ]

3.3 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | | | ]

04. ස්ත්‍රී/පුරුෂ භාවය :........................................................

05. 5.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :.............................................................

| *ඡන්ද හිමි නාම ලේඛණයට අනුව පදිංචිය* | *2016* | *2017* | *2018* |
|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාසය | | | |
| ඡන්ද ප්‍රදේශය | | | |
| ඡන්ද කොට්ඨාසය | | | |
| ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය | | | |
| ගෘහ අංකය | | | |
| නමට ඉදිරියෙන් ඇති පිළිවෙල අංකය | | | |

06. *අධ්‍යාපන සුදුසුකම් :*

| *විශ්වවිද්‍යාලය* | *ලබා ඇති උපාධිය* | *සහතිකපත් අංකය හා උපාධිය වලංගු දිනය* |
|---|---|---|
| | | |

07. *විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු :*

i. විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම :.............................................................................

ii. දිනය :............................................................................

iii. කුවිතාන්සි අංකය :.............................................................................

(මුදල් ගෙවා ලබාගත් ලදුපත මෙම තීරුවෙහි අලවන්න.)

**අයැදුම්කරුගේ ප්‍රකාශය**

මෙම අයැදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

.............................................
අයැදුම්කරුගේ අත්සන.

දිනය :.......................................

09. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන.......................................................................................................................... මහතා/මහත්මිය/මෙනෙවිය මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය අද දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

..................................................
සහතික කරන්නාගේ අත්සන.

දිනය :.....................................

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :............................................................................
තනතුර :............................................................................
ලිපිනය :............................................................................

10. රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයෙහි නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතුය.

මෙම ඉල්ලුම්කරු වන.................................................................................................................. මහතා/මහත්මිය/මෙනෙවිය මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ..................................................................................... වශයෙන් සේවය කරයි. පසුගිය වසර 05 තුළ ඔහු/ඇය මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහ ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා මුදා හැරිය හැකි බවත් සහතික කරමි.

..........................................................................................
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව සහිතව)

දිනය :......................................

06-574

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | රු. | ශ. |
|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... | ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට | ... | ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට | ... | ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැලකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2019 වර්ෂය** | | | |
| **ජූනි** | 2019.06.07 | සිකුරාදා | 2019.05.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.06.14 | සිකුරාදා | 2019.05.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.06.21 | සිකුරාදා | 2019.06.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.06.28 | සිකුරාදා | 2019.06.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජූලි** | 2019.07.05 | සිකුරාදා | 2019.06.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.07.12 | සිකුරාදා | 2019.06.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.07.19 | සිකුරාදා | 2019.07.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.07.26 | සිකුරාදා | 2019.07.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2019.08.02 | සිකුරාදා | 2019.07.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.08.09 | සිකුරාදා | 2019.07.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.08.16 | සිකුරාදා | 2019.08.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.08.23 | සිකුරාදා | 2019.08.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.08.30 | සිකුරාදා | 2019.08.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.